**කරන්දෙණිය ප්‍රාදේශීය සභාව**
**ගාල්ල දිස්ත්‍රික්කය**
**------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 අප්‍රේල් 06 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 17 දින ද විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2019 ජුනි 30 දින ද සභාපතිවරයාට යවා ඇත.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට කරන්දෙණිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු රු.12,430,693 ක දායක මුදල් වෙනුවෙන් ණයහිමි ප්‍රතිපාදන ඇති කර නොතිබුණි. | නිවැරදිව ප්‍රතිපාදනය කළ යුතුවේ. | 2020 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ආ) | 2017 වර්ෂයේ වැටුප් රහිත නිවාඩු සඳහා අයකල රු.212,911 ක මුදල වැටුප් හා වේතන වියදම් ගිණුම බැර කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | ප්‍රාදේශීය සභා සීමා මායිම් නාම පුවරුවක් සකසා ගැනීමට වැය වූ රු.240,000 ක මුදල ඉඩම් ගොඩනැගිලි යටතේ ප්‍රාග්ධනිත කර නොතිබුණි | නිවැරදි ශීර්ෂය යටතේ ගිණුම්ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ දී සී.සී.ටීවී කැමරා පද්ධතියක් සවිකිරීමට දරා තිබුණ වියදමින් රු.230,000 ක මුදලක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | නිවැරදි කාණ්ඩය යටතේ ගිණුම්ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඉ) | සමාලෝචිත වර්ෂය තුළ මිලදී ගෙන තිබුණු රු.31,100 ක ලී බඩු හා සවිකිරීම් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | නිවැරදිව ස්ථාවර වත්කම් ගිණුම්ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඊ) | සමාලෝචිත වර්ෂය තුළ මුද්දර ගාස්තු අඩුවෙන් ගණනය කිරීම් රු.1,292,391 ක් දෙවරක් ගිණුම් ගතකර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

### 1.3.2 නොසැසඳූ පාලන ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 04 කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ උපයෝගී ලේඛන / උපලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු.868,821 ක වෙනසක් විය. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | කාලයක සිට පවතින අසමාන -තාවයන් බැවින් ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

### 1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) **ලැබිය යුතු ගිණුම්** | | |
| (i) වර්ෂ 05 ට වැඩි එකතුව රු.2,339,889 ක් වූ හිඟහිටි ශේෂ 07 ක් හා වර්ෂ 01 ත් 05 ත් අතර එකතුව රු.2,754,134 ක හිඟහිටි ආදායම් ශේෂ 05 ක් අයකර ගැනීමට නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | හිඟ ආදායම් අයකර ගත යුතුවේ. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කරමි. |

| | | |
|---|---|---|
| (ii) 2015 වර්ෂයේ දී ඉන්ධන පිරවුම්හලකට ලබා දී තිබූ රු.151,800 ක තැන්පතුව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ගිවිසුම අවසන් වූ විට තැන්පතු ශේෂයන් අයකර ගත යුතුවේ. | ඉදිරියේ දී අයකර ගැනීමට කටයුතු කරමි. |

(ආ) ගෙවිය යුතු ගිණුම්

| | | |
|---|---|---|
| (i) 2015 වර්ෂයට පෙර සිට ගිණුම්වල දැක්වෙන ගෙවිය යුතු ණය පොලී රු.727,224 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ගෙවිය යුතු ගිණුම් ශේෂ පියවීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී ගෙවිය යුතු ගිණුම් ශේෂ නිරවුල් කරන බව දන්වමි. |
| (ii) 2012 වර්ෂය හා ඊට පෙර වර්ෂවලට අදාළ එකතු කල අගය මත බදු රු.11,423,376 ක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය නොකර පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. | ගෙවිය යුතු ගිණුම් ශේෂ පියවීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී ගෙවිය යුතු ගිණුම් ශේෂ නිරවුල් කරන බව දන්වමි. |

### 1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

**තොරතුරු ඉදිරිපත් නොකිරීම**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| එකතුව රු.121,053,328 ක් වූ ගිණුම් විෂයයන් 11 ක් සඳහා විගණනයට අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. | මූලා‍‍ ප්‍රකාශන වල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

### 1.4 අනුකූල නොවීම්

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| **නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ යනාදියට යොමුව** | **අනුකූල නොවීම** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| **(අ) පාර්ලිමේන්තු පනත්** | | | |
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) හා (2) වගන්ති | දියුණු කළ ප්‍රදේශ වරිපනම් කළාප ලෙස ප්‍රකාශයට පත්කර, වරිපනම් බදු අය කිරීමට කටයුතු කර නොතිබුණි. | පනතේ වගන්ති ප්‍රකාරව වරිපනම් කලාප ප්‍රකාශ කර, බදු අයකර ගැනීමට කටයුතු කල යුතුවේ. | ඉදිරියේ දී වරිපනම් බදු අය කරන බව දන්වමි. |

**(ආ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන ) රීති**

-------------------

| | | | |
|---|---|---|---|
| (i) රීති 33 | වරිපනම් බදු ගෙවීම පැහැර හැර ඇති පුද්ගලයන් පිළිබඳ ලැයිස්තු හා දේපල තහනම් කිරීමේ වරෙන්තු ලැයිස්තු පිළියෙල කර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී වරෙන්තු නිකුත් කර, හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කරමි. |
| (ii) රීති 193 | අයවැය සමඟ අය හා වැය විෂයයන් සසඳා අතිරික්තතා හා ඌණතාවලට හේතු දැක්වෙන ප්‍රකාශයක් පිළියෙල කර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී නිසි පරිදි කටයුතු කරමි. |
| (iii) රීති 218 | සභාව සතු සියළුම ඉඩම් හා ගොඩනැගිලි වාර්ෂිකව පරීක්ෂා කර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී නිසි පරිදි කටයුතු කරමි. |

**(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි**

-----------------------

| | | | |
|---|---|---|---|
| (i) මුදල් රෙගුලාසි 102-110 | නැතිවීම් සහ හානිවීම් පිළිබඳව කටයුතු කර, අදාළ වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණු අතර, අලාභ හානි පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ii) මුදල් රෙගුලාසි 104-109 | සභාවේ ඩබල් කැබ් රථය 2018 අගෝස්තු 23 දින හදිසි අනතුරකට භාජනය වී අළුත්වැඩියාව සඳහා රු.353,164 ක් වැය වී තිබූ නමුත්, මෙම අනතුර සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iii) මුදල් රෙගුලාසි 1645 හා 1646 | වාහනවල දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සභාවේ වාහන 12 ක ඉන්ධන දහන පරීක්ෂාව කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී ඉන්ධන පරීක්ෂාවක් කරන බව දන්වමි. |

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.635,648 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.17,479,978 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 3,337,800 | 2,988,790 | 2,580,090 | 4,540,050 | 3,537,600 | 2,890,690 | 2,794,173 | 4,143,785 |
| කුලී | 6,592,550 | 6,897,228 | 6,849,361 | 5,006,439 | 6,836,500 | 5,809,826 | 4,639,494 | 8,774,251 |
| බලපත්‍ර ගාස්තු | 450,000 | 352,829 | 352,829 | 123,350 | 400,000 | 152,250 | 154,250 | 123,500 |
| වෙනත් ආදායම් | 4,036,000 | 3,024,989 | 3,024,989 | 45,192 | 3,113,000 | 2,907,872 | 2,907,872 | 45,192 |
| | 14,416,350 | 13,263,836 | 12,807,269 | 9,715,031 | 13,887,100 | 11,760,638 | 10,495,789 | 13,086,728 |

#### 2.2.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| **(අ)** | **වරිපනම්** | | |
| (i) | සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂයට අදාළව අයකර ගත යුතුව තිබුණු රු.4,084,152 ක් වූ වරිපනම් බදු මුදලින් වර්ෂය තුල අය කිරීම් රු.621,971 ක් හෙවත් සියයට 15 ක් විය. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | ඉදිරියේ දී හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ප්‍රධාන කාර්යාල බල ප්‍රදේශයේ රු.548,007 ක් හා උප කාර්යාල බල ප්‍රදේශයේ රු.2,901,097 ක් වශයෙන් හිඟ වරිපනම් ශේෂයක් පැවතුණි. උප කාර්යාල බල ප්‍රදේශයේ හිඟ වරිපනම් ශේෂයෙහි වර්ෂ 05 ඉක්ම වූ හිඟ රු.1,216,243 ක් හා රු.10,000 ට වැඩි හිඟ ඒකක 35 ක එකතුව රු.662,025 ක් විය. | හිඟ බදු අයකර ගත යුතුවේ. | ඉදිරියේදී හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කරමි. |
| **(ආ)** | **අක්කර බදු**<br>--------------- | | |
| | සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂයට අදාළව අයවිය යුතුව තිබුණ රු.87,327 ක් වූ අක්කර බදු මුදලින් වර්ෂය තුළ අයකරගෙන තිබුණේ රු.4,421 ක් හෙවත් සියයට 05 ක් තරම් අවම අගයකි. | හිඟ බදු අයකර ගත යුතුවේ. | ඉදිරියේදී හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කරමි. |
| **(ඇ)** | **ජල බදු**<br>--------- | | |
| | සමාලෝචිත වර්ෂයට බිල් කළ ආදායම රු.826,890 ක් විය. ඉකුත් වර්ෂය හා සමාලෝචිත වර්ෂය වෙනුවෙන් රු.1,535,807 ක් රැස් කරගත යුතුව පැවති අතර, සමාලෝචිත වර්ෂයේ රැස්කල ආදායම රු.582,560 ක් හෙවත් සියයට 38 ක් පමණ විය. | හිඟ බදු අයකර ගත යුතුවේ. | ඉදිරියේදී හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කරමි. |
| **(ඈ)** | **විනෝද බදු**<br>-------------- | | |
| | සමාලෝචිත වර්ෂය සඳහා ඇස්තමේන්තුගත විනෝද බදු ආදායම රු.250,000 ක් වූ අතර, බිල් කළ හා රැස් කළ ආදායම රු.40,000 ක් විය. | ඇස්තමේන්තු තාත්විකව සිදුකල යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. |

**2.2.3** බදු කුලී

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) කඩ කුලී | | |
| සමාලෝචිත වර්ෂයට බිල් කිරීම් රු.3,278,729 ක් වූ අතර, සමාලෝචිත වර්ෂය තුළ රැස් කළ යුතු සමස්ථ කඩ කුලී ආදායම රු.10,515,883 ක් විය. වර්ෂය තුළ රැස් කළ ආදායම රු.3,366,783 ක් හෙවත් සියයට 32 ක් තරම් අඩු අගයක් විය. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | ඉදිරියේ දී හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කරමි. |
| (ආ) වෙළඳ අයිතිය බදු දීම | | |
| (i) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ මාළු වෙළඳසැල් කුලී ශේෂය රු.193,034 ක් විය. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | ඉදිරියේ දී හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කරමි. |
| (ii) සමාලෝචිත වර්ෂය ආරම්භයට හිඟව පැවති පොල බදු ආදායම රු.518,434 ක් වූ අතර, වර්ෂයේ බිල් කිරීම් රු.352,299 ක් විය. ඒ අනුව වර්ෂයට අයවිය යුතු සමස්ථ පොළ බදු ආදායම රු.4,041,433 ක් වුවද, වර්ෂය තුළ රැස් කළ ආදායම රු.3,386,399 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පොළ බදු හිඟය රු.655,034 ක් විය. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | ඉදිරියේදී හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කරමි. |

**2.2.5** උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව පැවති උසාවි දඩ රු.845,733 ක් හා මුද්දර ගාස්තු රු.31,627,950 ක් විය. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | ඉදිරියේ දී හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කරමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

#### (අ) ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පනවා තිබුණ අතුරු ව්‍යවස්ථාව අනුව සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතුවේ. | ඉදිරියේ දී වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීමට කටයුතු කරමි. |

#### (ආ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| කසළ කළමනාකරණය සඳහා විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි. | කසළ බැහැර කිරීම සඳහා විධිමත් හා දීර්ඝකාලීන වැඩපිළිවෙලක් සකස් කළ යුතුවේ. | ඉඩමක් ලබාගෙන කසළ බැහැර කරලීම සඳහා ඉදිරියේ දී විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කරන බව දන්වමි. |

#### (ඇ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ, තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක සඳහා වන ගෝලීය දර්ශක තුලින් සහා බලප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නැංවීම සඳහා වන දිගුකාලීන සැලසුම් සභාව විසින් සකස් කර නොතිබුණි. | තිරසර සංවර්ධන සඳහා වන දීර්ඝකාලීන සැලසුම් සකස් කර ජනතාවගේ ජීවන තත්ත්වය ඉහල නැංවිය යුතුවේ. | බල ප්‍රදේශයේ ජනතාවගේ ජීවන තත්ත්වය ඉහල නැංවීමට ඉදිරියේ දී සැලැස්මක් සකස් කරන බව දන්වමි. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දී වීථි පහන් උපකරණ මිලදී ගැනීම සඳහා රු.1,631,264 ක වියදමක් දරා තිබුණු අතර, වීථි පහන් 5000 ක් පමණ නඩත්තු කර තිබූ නමුත්, 2008 වර්ෂයෙන් පසු විදුලිබල මණ්ඩලය සමඟ ගිවිසුම්වලට එළඹ නොතිබීම හේතුවෙන් වීථි පහන් නඩත්තුව වෙනුවෙන් වියදම් ප්‍රතිපූර්ණය කර ගැනීමට නොහැකි වී තිබුණි. | විදුලිබල මණ්ඩලය සමඟ ගිවිසුම්වලට එළඹ වීථි පහන් නඩත්තු මුදල අයකර ගත යුතුවේ. | ඉදිරියේ දී අයකර ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | මහජ්දණ්ඩ කඩ කාමර වලින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු එක්වන් මුදල් රු.21,896,750 ක් අයකර ගෙන නොතිබුණි. | එක්වන් මුදල් අයකර ගත යුතුවේ. | ඉදිරියේ දී අයකර ගැනීමට කටයුතු කරමි. |
| (ඇ) | ඌරගස්මංහන්දිය තැපැල් කාර්යාලය අසල පැවති වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 03 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා කුලියට දීමට කටයුතු නොකිරීමෙන් සභාවට උපයා ගත හැකිව තිබූ ආදායම අහිමි වී තිබුණි. | කඩ කාමර බදු දී ආදායම් උපයා ගැනීමට කටයුතු කළ යුතුවේ. | බදු දීමට කටයුතු කරමි. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සේවක පුරප්පාඩු හා අතිරික්ත | | |
| (i) | අතිරික්තව පැවති තනතුරක් විධිමත් කර ගැනීමටත්, ප්‍රාථමික අංශයේ තනතුරු 15 ක පුරප්පාඩු සඳහා බඳවා ගැනීමටත් කටයුතු කර නොතිබුණි. | පුරප්පාඩු සඳහා බඳවා ගැනීමටත්, අතිරික්ත තනතුර විධිමත් කර ගැනීමටත් කටයුතු කළ යුතුවේ. | පුරප්පාඩු බඳවා ගැනීමටත් අතිරික්ත තනතුර විධිමත් කර ගැනීමට කටයුතු කරමි. |
| (ii) | සේවක සැලැස්මට අනුව අනුමත කළමනාකරණ සහකාරවරු සංඛ්‍යාව 07 ක් වූ අතර, තථ්‍ය සංඛ්‍යාව 08 ක් විය. තවද කළමනාකරණ සහකාර තනතුරට අදාළ රාජකාරි ආවරණය කිරීමට පුස්තකාල සහායිකාවක හා වැඩ / ක්ෂේත්‍ර කම්කරුවන් දෙදෙනෙකු ද යොදවාගෙන තිබුණි. | අනියම් හා ආදේශක තනතුරු විධිමත්ව බඳවා ගත යුතුවේ. | ඉදිරියේ දී විධිමත්ව බඳවා ගැනීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (iii) | ඖෂධ සංයෝජක තනතුරු දෙකක් අනුමතව තිබිය දී ආයුර්වේද මධ්‍යස්ථාන දෙකෙහි බෙහෙත් නිකුත් කිරීමේ රාජකාරි කටයුතු සඳහා ස්ථිර වැඩ / ක්ෂේත්‍ර කම්කරුවකුට හා අනියම් සේවිකාවකට පවරා තිබුණි. | සුදුසුකම් ලත් නිලධාරීන් යෙදවිය යුතුවේ. | ඉදිරියේ දී බඳවා ගැනීම් කර, සුදුසුකම් ලත් අය යෙදවීමට කටයුතු කරමි. |
| (ආ) | සේවක ණය<br>-------------<br>සභාවේ නිලධාරීන් හා සේවකයින් 50 දෙනෙකුට නිකුත් කල සේවක ණය රු.736,456 ක් අය කරගෙන නොතිබූ අතර, එම ණය ශේෂය තුළ පැවති රු.412,323 ක් 2011 වර්ෂයට පෙර සිට අය නොවී පැවතුණි. | හිඟ සේවක ණය අයකර ගත යුතුවේ. | තොරතුරු සොයාගෙන සේවක ණය අයකර ගැනීමට කටයුතු කරමි. |

**3.4 වත්කම් කළමනාකරණය**

--------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------------------------ | ------------ | ------------------- |
| **(අ)** | **වත්කම් පවරා නොගැනීම**<br>-------------------------------- | | |
| | පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙන් 1999 වර්ෂයේ ලබා දී තිබූ කැබ් රථයෙහි අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුවේ. | අයිතිය පවරා ගැනීමට කටයුතු කරමි. |
| **(ආ)** | **නිශ්ක්‍රීය වත්කම්**<br>------------------------ | | |
| | (i) අංක රහිත ජල බවුසරය, ට්‍රැක්ටර් ට්‍රේලරය හා විදුලි කාර්මික වැඩ සඳහා යොදාගත් හාඩිමෙක් යන්ත්‍රය වර්ෂ 05 කට අධික කාලයක් භාවිතයෙන් තොරව පැවතුණි. | අපහරණය කිරීමට හෝ අළුතවැඩයා කංමට කටයුතු කළ යුතුවේ. | අපහරණය කිරීමට කටයුතු කංම |
| | (ii) 2015 වර්ෂයට පෙර කොම්පෝස්ට් නිෂ්පාදනය කිරීමට යොදාගත් කසළ හලන යන්ත්‍රයක් හා කසළ කැබලි කිරීමේ යන්ත්‍රයක් නිෂ්කාර්යයව පැවතුණි. | කසළ බැහැර කිරීම සඳහා විධිමත් හා දීර්ඝකාලීන වැඩපිළිවෙලක් සකස් කළ යුතුවේ. | ඉඩමක් ලබාගෙන කසළ බැහැර කරලීම සඳහා ඉදිරියේ දී විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කරන බව දන්වමි. |

(ඇ) **ඌන උපයෝජිත වත්කම්**

| | | |
|---|---|---|
| 2015 වර්ෂයේ දී ලැබී තිබූ රු.24,928,666 ක් වටිනා මෝටර් ග්‍රේඩරය සභාවට ලැබුණු අවස්ථාවේ සිටම කිසිදු ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. | සභාව සතු වත්කම් ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුවේ. | අපහරණය කිරීමට කටයුතු කරමි. |

**4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය**

**4.1 අභ්‍යන්තර විගණනය**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ ප්‍රකාර කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී අභ්‍යන්තර විගණනයක් සිදුකර වාර්තා එවීමට කටයුතු කරමි. |

**4.2 විගණන හා කළමනාකරණ කමිටු**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ එක් විගණන හා කළමනාකරණ කමිටුවක් පමණක් පවත්වා තිබුණි. | කාර්තුවකට එකක් වන පරිදි පැවැත්විය යුතුවේ. | ඉදිරියේ දී චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කරමි. |